

**සැබෑ මිනිසා වාසිය රැඳී ඇති මාවත් නොසොයයි**
**ඔහු සොයන්නේ යුක්තිය රැඳී ඇති මාවතයි**

ජොසේ මාටි


# සන්නස

Sannasa
244 Princes Hwy
Hallam Vic 3803 Australia
Web: www.sannasa.net
www.sannasa.com
email :sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241after 4pm

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සංස්කරණ උපදේශක / Editorial Advisor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රචා / Graphics**
ශානලී එදිරිසිංහ Shanalee Edirisinghe

**වෙළඳ දැන්වීම් / Advertising**

**S Jayasinghe**
03 8707 4604
0402 025 516
email- sjturaus@optusnet.com.au

**Kuma Gamage**
0414 215 280
email- ads.sannasa@gmail.com

**Account Details for Payments**

**Account Name** - **Sannasa Media**
Bank - Westpac
BSB Number - 033 341
Account Number - 590847

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වී ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සේයා රූ / Photography**
Prasanna Kurukularatna

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku

**WA**
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhdist Vihara

**QLD**
Ananada Samaratunga
2, Santorini Pl.
Forest Lake
QLD 4078
(07) 3372 7958

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**SA**
Chandra Eeriyagama
08 8331 2318


පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

## ලියා දන්වන වගයි

## එක්ව දිනමුද? වෙන්ව නැසෙමුද?

ප්‍රශ්නය අසන්නට සිදුව ඇත්තේ එක්සත් ජාතික පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහගෙන්ය.

රජය මේ ගමන් කරමින් සිටින්නේ තනි පවුලක ඒකාධිපතිවාදී පාලනයක් ස්ථාපිත කරන්නටය. මොළය කළඳක් හෝ ඇති ඕනෑම කෙනෙකුට එය වැටහයි. නොවැටහෙන්නේ පාට කණ්නාඩි වලින් බලා සිටිනා අතළොස්සකට පමණයි. නොවැටහෙන්නේ රජයේ මායාකාරී ප්‍රචාරක යාන්ත්‍රණයෙන් මුළා වී සිටිනවුන්ට පමණකි. රජයේ මේ ගමන වහා නැවැත්විය යුතුය. පිහිය රන් යයි කියා ඇන ගන්නා මෝඩයන් ඈත අතීතයේදීවත් සිටියේ නැත.

රජය ලහි ලහියේ ජනාධිපතිවරණයකට සැරසෙමින් සිටියි.

විපක්ෂයක් ලෙස එක්සත් වුවහොත් ජනාධිපතිවරයා පැරදවිය හැකි බව ස්ථිරය. එහෙත් ඒ සඳහා සෑම සියළු පක්ෂ සහ කන්ඩායම් එක්සත් විය යුතුය. එක්සත් වී එක් අපේක්ෂකයකු ඉදිරිපත් කළ යුතුය. ඒ අපේක්ෂකයා කලින් ගිවිසා ගත් යම් නිශ්චිත වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර රට මේ ඒකාධිපතිත්වයෙන් ගොඩ ගත යුතුය. ගරු මාදුළුවාවවේ සෝභිත හිමියන් ඇතුළු විද්වතුන් රැසක් මේ වෙහෙසෙන්නේ ඒ වෙනුවෙන්ය.

ඒ වැඩ පිළිවෙලට අනාගතයේදී මෙවන් ඒකාධිපති පාලනයක් නැවත ඇති නොවන සේ ජනාධිපතිධුරය අහෝසි කර පාර්ලිමේන්තුවෙන් තෝරාපත් කර ගන්නා රාජ්‍ය නායකයකු පත් කිරීමද ඇතුළත්ය. විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහද මේ ක්‍රියාවලියට එකඟව සිටියේය. එහෙත් ඔහුගේ ආත්මාර්ථකාමීත්වයත් ඔහු වටා සිටින මුග්ධ උපදේශකයන්ගේ බලපෑමත් යටතේ රනිල් පිලි පැන යන්නට පටන් ගෙන සිටියි. දැන් ඔහු ක්‍රියාත්මක වන්නේ වෙනත් කිසිදු පක්ෂයක කණ්ඩායමක සහයෝගයක් නැතිව තනිකරම එක්සත් ජාතික පක්ෂ ඡන්ද වලින් දිනන්නට හැකිය යන මුග්ධ සිතිවිල්ල ඉදිරියට දමාගෙනය.

විපක්ෂයේ පක්ෂයක් ලෙස වැඩි ඡන්ද ප්‍රමාණයක් ඇත්තේ එක්සත් ජාතික පක්ෂය සතුවය. එසේ වුවද ඒ ප්‍රමාණය බලයේ සිටින ජනාධිපතිවරයකු පැරදවීම සඳහා කොහෙත්ම ප්‍රමාණවත් නැත. ඌවේ ඡන්දයෙන් ලද ප්‍රගතියෙන් අන්ධ වී රනිල් මේ සැරසෙන්නේ තමනුත් නැසී රටත් නසන්නටය. අපට වේදනාව ඇත්තේ රනිල් නම් වන මිනිසා ගැන නොවේ. අපේ රට ගැනය.

සංස්කාරක



# මීරියබැද්ද නාය ගියාද යැව්වද?

## හිටපු ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජිනදාස කටුපොත

පසුගියදා බෙරගල කොස්ලන්ද මීරියබැද්ද ප්‍රදේශයේ සිදු වූ නාය යෑම මෙරට ඉතිහාසයේ වැඩිම ජීවිත හානි සිදු වූ නාය යෑම ලෙස සැලකේ. නාය යෑමත්, ගංවතුර, සුළි සුළං, සුනාමි වැනි ස්වාභාවික ආපදාවකි. නමුත් මේ ආපදා නිසි ලෙස කළමනාකරණය කර ගන්නේනම් ඉන් සිදුවන ජීවිත හානි අවම කරගත හැකිය. අපේ රටේ කවර ස්වාභාවික විපතක් වුවත් ඉන් සිදුවන ජීවිත හානි සුළුපටු නොවන්නේ අපේ රටේ ආපදා කළමනාකරණය නිසි ලෙස සිදුනොවන නිසා බව ශ්‍රී ජයවර්ධන පුර විශ්වවිද්‍යාලයේ භූ විද්‍යාව පිළිබඳ හිටපු ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජිනදාස කටුපොත මහතාගේ අදහසයි.
මහාචාර්ය ජිනදාස කටුපොත වසර ගණනාවක් තිස්සේ බෙරගල, හපුතලේ කොස්ලන්ද ප්‍රදේශයන්හි භූ විද්‍යාත්මක පර්යේෂණයන් හි නියැලි විද්‍යාඥයෙකි.

**බෙරගල කොස්ලන්ද ප්‍රදේශය නිතර නාය යෑම්වලට ලක්වන ප්‍රදේශයක්ද?**

බෙරගල සිට හපුතලේ පාරත් බෙරගල සිට වැල්ලවාය පාරත් අතර මේ ප්‍රදේශය අපි දන්න කාලෙ ඉඳන්ම සක්‍රිය කලාපයක්. එනම් පසුගිය අවුරුදු

*පසුගිය වසර 10 - 15 තුළ ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විශාල පරිශ්‍රමයක් දරල මේ නාය යන ප්‍රදේශවල සිතියම් නිර්මාණය කළා. මේ මේ ප්‍රදේශවල කිසිදු ඉදිකිරීමක් නොකරන ලෙස දැනුම් දුන්නා.*

20 ක පමණ කාලයක සිට මේ ප්‍රදේශය වසර 7 - 8 කට වරක් නාය යෑම්වලට ලක්ව තිබෙනවා. එම නිසා කොස්ලන්ද මීරියබැද්ද මේ ප්‍රදේශයට නාය යෑම අලුත් දෙයක් නෙවෙයි.

6 වන පිටට